# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2335/08 – 2023 ජුනි මස 06 වැනි අඟහරුවාදා – 2023.06.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2020/19.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.01.07 දිනැති හා අංක 2313/68 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.12.29 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාතලේ, කවුඩුපැලැල්ල, හයිලෙවල් වත්ත, අංක 90 හි පදිංචි එච්.එම්.ඩබ්.අබේරත්න මයා සහ කොළඹ 05, නාරාහේන්පිට, කිරුළ පාර, අංක 200හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.05.03 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මැයි මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කම්කරු දෙපාර්තමේන්තුවේ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය

එච්.එම්.ඩබ්. අබේරත්න මයා,
අංක 90,
හයිලෙවෙල් වත්ත,
කවුඩුපැලැල්ල,
මාතලේ.

*(පළමු පාර්ශ්වය)*

නඩු අංකයඃ A/01/2023.
IR/COM/03/2020/19.

*එදිරිව*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
නො. 200,
කිරුළ පාර,
කොළඹ - 05.

අතර පවත්නා කාර්මික ආරාවුල

*(දෙවන පාර්ශ්වය)*

**ප්‍රදානය**

**පෙනී සිටීම :-**

| | | |
|---|---|---|
| පළමු පාර්ශ්වය වෙනුවෙන් | - | ඉල්ලුම්කරු එච්.එම්.ඩබ්. අබේරත්න මහතා |
| දෙවන පාර්ශ්වය වෙනුවෙන් | - | 1. නීති නිලධාරි - දිල්රුක්ෂි ලියනගේ මිය |
| | | 2. නීතිඥ ප්‍රමෝද පෙරේරා මහතා |
| | | 3. නීතිඥ චිරස්ති සෙනෙවිරත්න මිය |
| | | 4. සහකාර මානව සම්පත් කළමණාකරු (කාර්මික සබඳතා) යමුනා දහනායක මිය |
| | | 5. ප්‍රාදේශීය මුදල් කළමණාකාරි - කුමාරි තෙන්නකෝන් මිය |
| | | 6. පරිපාලන නිලධාරි සංජීව ඉලංගකෝන් මහතා |
| | | 7. ලිපිකරු - රංගන සුධීර රාජපක්ෂ මයා |

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය ගරු මනුෂ නානායක්කාර මැතිතුමා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා ) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මා වෙත පවරා ඇත.

පාර්ශ්වයන් අතර ආරාවුලට තුඩු වූ හේතුව වනුයේ
"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කළ එච්.එම්.ඩබ්. අබේරත්න මහතාට සේවයේ ඇගයීමක් වශයෙන් 2004.02.01 දින ලබා දෙන ලද වේතන වර්ධක තුන (03) 2004 මැයි සිට ඉවත් කර අත්හිටුවා නැවත 2017.01.01 දින සිට ගෙවීම් කළ ද 2004 මැයි සිට 2016 දෙසැම්බර් දක්වා ගෙවීම් කපා හැරීම නිසා අසාධාරණයක් සිදුව තිබේද? යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.

මෙම කාර්මික අධිකරණයේ අදාල නඩුව පැවැත්වූ දිනයන්

| | | | |
|---|---|---|---|
| 2023.01.17 | 2023.03.09 | 2023.02.07 | 2023.03.28 |
| | | 2023.02.20 | 2023.04.19 |
| 2023.01.26 | 2023.03.14 | 2023.02.24 | |

*මෙම බේරුම්කරණයේ පසුබිම හා එය පැවැත්වූ ආකාරය*

මෙම නඩුව 2023.01.17 දින පලමු වරට කැඳවූ අවස්ථාවේ, ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටියේ තමා වෙනුවෙන් නියෝජිතයකු පෙනී නොසිටින අතර, තමාම පෙනී සිටින බවයි. එදින ඔහු තම පළමු ප්‍රකාශය පිටපත් 03 කින් ඉදිරිපත් කරන ලදී.

දෙවන පාර්ශ්වය ඔවුන්ගේ පලමු ප්‍රකාශය 2023.01.17 දින ඉදිරිපත් කිරීමට අපොහොසත් විය. තවද 2023,01.26 දින පළමු ප්‍රකාශය ඇමුණුම් රහිතව අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදී.

මෙම ආරාවුලට අදාල ඉල්ලුම්කරු වන එච්. එම්. ඩබ්. අබේරත්න මහතා 2004.01.19 වන විට මහනුවර බස් සමාගමට අයත් මාතලේ ඩිපෝවේ ඩිපෝ කළමණාකරු වශයෙන් සේවය කර ඇති අතර ඔහු 2018.09.27 දින විශ්‍රාම ගොස් ඇත.

2004.01.29 දින මහනුවර බස් කම්පැණි ලිමිටඩ්හි සේවක මණ්ඩල කළමණාකරු විසින් ඔහුගේ අංක මබස/සේමකො/ පා/01/2004 හා 2004/01/29 ලිපියෙන් 2004.02.01 දින සිට වැටුප් වර්ධක 03 ක් මාතලේ ඩිපෝ කළමණාකරු වශයෙන් සේවය කළ එච්.එම්.ඩබ්. අබේරත්න මහතාට ලබා දී තිබේ. මෙම වැටුප් වර්ධක 2004 වර්ෂයේ පෙබරවාරි, මාර්තු, අප්‍රේල් මාස සඳහා ගෙවා ඇතත්, 2004 මැයි මස සිට මහනුවර බස් කම්පැණි ලිමිටඩ් හි සේවක මණ්ඩල කළමණාකාරතැනගේ අංක මබස/සේමකො/පා/01/2004 හා 2004/05/07 ලිපියෙන් මෙම අමතර වැටුප් වර්ධක 03 අත්හිටුවා ඇත. (පැ 2)

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති වෙත වැටුප් වර්ධක අත්හිටුවීමෙන් අගතියට පත් වූ සේවකයන් විසින් කරන ලද අභියාචනා සැලකිල්ලට ගෙන එම වැටුප් වර්ධක ලබා දීම 2017.01.01 සිට ගෙවීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන මානව සම්පත් කළමණාකාර තැනගේ (X4) ලිපිය අනුව 2004 වර්ෂයේ සිට අදාල වැටුප් පියවරේ තබා 2017 වර්ෂයේ ජනවාරි මස සිට අත්හිටවූ වැටුප් වර්ධක හිඟ වැටුප් රහිතව ලබා දෙන ලෙසට, ඔහුගේ අංක ශ්‍රීලංගම මාසක/වලි/2017 හා 2017.12.06 දින දරන ලිපියෙන් මෙම අනුමැතිය ලබා දී ඇත. ප්‍රධාන මානව සම්පත් කළමණාකරු විසින් ඔහුගේ අංක ශ්‍රීලංගම/මාසික/වලි/2017 හා 2017.05.08 දින දරන ලිපියෙන් මෙම අමතර වැටුප් වර්ධක 03, 2017 වර්ෂයේ ජනවාරි මස සිට හිඟ වැටුප් රහිතව ගෙවීම් කිරීමට ශ්‍රීලංගම සභාපති අනුමත කළ බව ඉල්ලුම්කරු වෙත දැනුම් දී ඇත. (X5)

මේ අනුව ගණනය කර ඉල්ලුම්කරු විශ්‍රාම ගිය 2018.09.27 දින දක්වා ගෙවීම් කර ඇති බව, 2023.01.17 දින ඉල්ලුම්කරු මෙම අධිකරණයේදී ප්‍රකාශ කර ඇත. (පිටු අංක 13)

එහෙත් මාතලේ ඩිපෝවේ කළමණාකරු වශයෙන් සේවය කල ඩබ්.එම්. ආනන්ද මහතාට මෙම වේතන වර්ධක 03 අදාල මුදල් ද, හිඟ මුදල් ද සමඟ ගෙවා ඇති බවත්, එක හා සමාන සිදුවීමකදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය දෙවිදියකට කටයුතු කිරීමෙන් තමාට අසාධාරණයක් සිදුවී ඇති බව ඉල්ලුම්කරු 2023.01.17 දින අධිකරණයේදී ප්‍රකාශ කර ඇත.

මේ සම්බන්ධයෙන් ආරම්භයේ සිටම දෙවන පාර්ශ්වය දැරූ මතය වූයේ ඉල්ලුම්කරු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන මානව සම්පත් කළමණාකරුගේ 2017 අංක 09 දරන මානව සම්පත් කළමණාකරන කොට්ඨාස චක්‍ර ලිපිය අනුව (ශ්‍රී ලංගම/මාසක/වලි/201) හා 2017.12.06 අනුව බව 2023/01/26 දින අධිකරණය විසින් කරන ලද ප්‍රශ්න කිරීම්වලදී දෙවන පාර්ශ්වය පහත කරන ලද ප්‍රකාශ වලින් තහවුරු වේ.

ප්‍ර. දැන් ඒ 2017 චක්‍රලේඛයේ මොකද්ද සඳහන් වෙලා තිබෙන්නේ.

පි. එහි සඳහන් වෙන්නේ 2004 මැයි මාසවල අත්හිටුවන ලද මාස හතරක් තිස්සේ ගෙවන ලද වැටුප් වර්ධක පෙර ගෙවීම් නොමැතිව 2017 ජනවාරි මස සිට ගෙවීම් කරන්න කියලා. ඒ අනුව ගෙවීම් කරලා තිබෙනවා.

2023.03.14 දින කාර්මික අධිකරණයේදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සහකාර මානව සම්පත් කළමණාකරු (කම්කරු සබඳතා) යමුනා දහනායක මහත්මිය. දෙවන පාර්ශ්වය වෙනුවෙන්, සාක්ෂි ලබාදුන් අතර, ඇයගෙන් ඉල්ලුම්කරු විසින් අසන ලද හරස් ප්‍රශ්න වලදී කළ ප්‍රකාශ පහත දක්වා ඇත.

ප්‍ර. X (4) දරන ලිපිය නිල මුද්‍රාව තබා අනුමත කර තිබෙන්නේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මානව සම්පත් කීයොත් නිවැරදියි.

පි. ඔව්.

ප්‍ර. 2018.10.18 වන දින ශ්‍රී ලංගම/මාසක/ගම්/සබ 2018 දරන ලිපිය නිල මුද්‍රාව අත්සන් කර තිබෙන්නේ ප්‍රධාන මානව සම්පත් කළමණාකාර තැනද?

පි. ඔව්. එවකට සිටි ප්‍රධාන මානව සම්පත් කළමණාකරු

ප්‍ර. ඩබ්.එම්. ආනන්ද මහතා මහනුවර උතුර ඩිපෝව කළමණාකරු වශයෙන් සිට විශ්‍රාම ගියාට පසු වේතන වර්ධක 2004 මැයි මස සිට ඔහු විශ්‍රාම යන තෙක් ගෙවීම් කරන ලෙසට ප්‍රධාන මානව සම්පත් කළමණාකරු මෙම ලිපිය මගින් සටහන් කර තිබෙනවාද?

පි. ආනන්ද මහතාට 2004/01/29 දාතමින් මහනුවර බස් සමාගම් සේවක මණ්ඩල කළමණාකාරතුමා විසින් නිකුත් කර ඇති මබස/සේ.ම.කො/1/2004 ලිපිය අනුව ලබාදී ඇති වැටුප් වර්ධක 3 අත්හිටුවා ඇති දින සිට ඔහු විශ්‍රාම ගිය දිනය දක්වා හිඟ මුදල් ගණනය කර ගෙවීමෙන් විශ්‍රාම පාරිතෝෂික මුදල් ගණනය කර ගෙවන ලෙස දන්වා සිටී. (පැ 4)

මේ අනුව පැහැදිලි වන්නේ විශේෂ වැටුප් වර්ධක 3 ලැබූ මහනුවර උතුරු ඩිපෝවේ කළමණාකරු වශයෙන් කටයුතු කළ ඩබ්.එම්. ආනන්ද මහතාට විශ්‍රාම ගිය දිනය දක්වා හිඟ මුදල් ගණනය කර ගෙවා ඇති බවයි. (පිටු අංක 127)

මෙම ආරාවුලට අදාල විශ්‍රාමික ඩබ්.එම්. ආනන්ද මහතා විසින් කම්කරු දෙපාර්තමේන්තුවට කරන ලද පැමිණිල්ලට අනුව පවත්වාගෙන ගිය ගොනු අංකය වන 1R/COM/03/2018/108 ගොනුව ගෙන්වාගෙන අධිකරණයේ දී පරික්ෂා කල විට, ඒ බැව් සනාථ විය. (සහකාර මානව සම්පත් කළමණාකාරී යමුනා දහනායක මහත්මිය සාක්ෂි දෙමින් ශ්‍රීලංගම/මාසක/සං 2018 හා 2018/09/20 ලිපිය පිටු අංක 9 2018/10/10 දින උපලේඛනය ඇය විසින් පරීක්ෂා කර පිළිගන්නා ලදි.) (පිටු අංක 11)

තවද මෙම නියමය කරන විට 2017 චක්‍ර ලිපිය නිකුත් වී තිබුණ බැව් නිරීක්ෂණය වූ අතර, එය නොසලකා හිඟ වැටුප් ගෙවීමට ප්‍රධාන මානව සම්පත් කළමණාකරු විසින් ප්‍රධාන ප්‍රාදේශීය කළමණාකාර ශ්‍රී ලංගම මහනුවර ප්‍රාදේශිකය වෙත (පැ.4) 2018/10/11 ලිපියෙන් දන්වා ඇත.

එකම දිනයකදී එකම තනතුර දරන ලද හා විශේෂ වැටුප් වර්ධක 03 ක් ලැබූ මහනුවර, උතුරු ඩිපෝවේ ඩබ්.එම්. ආනන්ද මහතාට, විශ්‍රාම යාමෙන් පසුව සහ 2017 චක්‍ර ලිපිය නිකුත් වීමෙන් පසු 2018/10/11 දාතමින්, හිඟ වැටුප් ගෙවීමට තීරණය කිරීම තුළින්, ගම්‍ය වන්නේ එම විශේෂ වැටුප් වර්ධක 03 ලැබූ එච්. එම්.ඩබ්. අබේරත්න මහතාට හිඟ වැටුප් මසකට රු. 390 බැගින් නොගෙවීමෙන් අසාධාරණයක් සිදුවී ඇති බවයි.

සහකාර මානව සම්පත් කළමණාකාර යමුනා දහනායක මහත්මිය 2023/03/14 මෙම අධිකරණයේ සාක්ෂි දෙමින්,

ප්‍ර. විශේෂ වැටුප් වර්ධක 03 ක් සමග ද පාරිතෝෂිකය ගණනය කර තිබෙන්නේ,

පි. ඔව්

ප්‍ර.මොහුට 130 බැගින් අහිමි වෙලා තිබෙන්නේ කුමක්ද?

පි. 2017 සභාපතිතුමාගේ නියෝගය පරිදි හිඟ වැටුප් නැතිව තමයි ගණනය කර තිබෙන්නේ 130 ක් ගෙවීමට තිබෙනවා.

**නිරීක්ෂණ හා නිගමනයන්**

ඉල්ලුම්කරු වන එච්.එම්.ඩබ්. අබේරත්න මහතා මහනුවර බස් කම්පැණි ලිමිටඩ් හි මාතලේ ඩිපෝවේ කළමණාකරු වශයෙන් 2004/1/19 සිට සේවය කර ඇති අතර, ඔහු 2018/09/27 දින ඔහු සේවයෙන් විශ්‍රාම ගොස් ඇත.

මොහු මාතලේ ඩිපෝ කළමණාකරු වශයෙන් කටයුතු කළ අවධියේ මහනුවර බස් සමාගමේ සේවක මණ්ඩල කළමණාකරුගේ 2004/01/29 ලිපියෙන් විශේෂ වේතන වර්ධක 03 ක් ලබා දී ඇත.

මෙම වැටුප් වර්ධක (03) 2004 පෙබරවාරි/ මාර්තු/අප්‍රේල් මස ගෙවීමෙන් පසු මැයි මස සිට අත්හිටුවා ඇත. එයට පාදක වී ඇත්තේ, මහනුවර බස් කම්පැණි ලිමිටඩ් හි සේවක මණ්ඩල කළමණාකාරගේ අංක මබස/සේමකො/කා/04/2004 හා 2004/06/21 ලිපියෙන් වැටුප් වර්ධක නවතා දැමීමයි.

ඉන්පසු ශ්‍රී ලංගම ප්‍රධාන මානව සම්පත් කළමනාකාර තැනගේ අංක ශ්‍රී ලංගම/මාසක/වලි/ 2017 හා 2017/02/06 ලිපියෙන් අත්හිටුවන ලද වැටුප් වර්ධක හිඟ වැටුප් රහිතව ගෙවීමට කටයුතු කර ඇත.

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති වෙත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන් විසින් කරන ලද අභියාචනා අනුව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපතිගේ අනුමැතිය පරිදි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන මානව සම්පත් කළමණාකාර තැනගේ (X4) ලිපිය අනුව 2004 වර්ෂයේ සිට අදාළ වැටුප් පියවරේ තබා 2004 වර්ෂයේ ජනවාරි මස සිට අත්හිට වූ වැටුප් වර්ධක හිඟ වැටුප් රහිතව ලබාදෙන ලෙසට ඔහුගේ අංක ශ්‍රී ලංගම මාසක/ වලි/2017 හා 2017.12.06 දින දරන ලිපියෙන්

අනුමැතිය ලබා දී ඇත. මේ අනුව ප්‍රධාන මානව සම්පත් කළමණාකරු විසින් ඔහුගේ අංක ශ්‍රී ලංගම/ මාසක/පවැ/2017 හා 2017.05.08 දරන ලිපියෙන් ඒ බව ඉල්ලුම්කරු වෙත දැනුම්දී ඇත. (X5)

ඒ අනුව ඉල්ලුම්කරුට ද ඔහු විශ්‍රාම ගිය 2018/09/27 දක්වා හිඟ වැටුප් රහිතව ගෙවීම් කර ඇත.

ඉන්පසු මහනුවර බස් කම්පැණි ලිමිටඩ් හි මාතලේ ඩිපෝ අධිකාරවරයකු වශයෙන් සේවයකල ඩබ්ලිව්.එම්. ආනන්ද මහතාට 2016/10/25 විශ්‍රාම ගිය අය විසින් කම්කරු දෙපාර්තමේන්තුවට කරන ලද පැමිණිලි අංක IR/COM/03/2018/108 ගොනුවට අනුව ඩබ්ලිව්.එම්. ආනන්ද මහතාට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හා තිබූ කාර්මික ආරාවුල හිඟ වැටුප් ගෙවීමේ එකඟතාවය මත සමථයකට පත් වී ඇති බව තහවුරු විය.

මේ අනුව ශ්‍රී ලංගම/2017 චක්‍ර ලිපියෙන් හිඟ වැටුප් රහිතව ගෙවීම් කිරීමට උපදෙස් දී තිබුණත් එය නොසලකා හරිමින් විශ්‍රාමික ඩිපෝ අධිකාරි ඩබ්ලිව්.එම්. ආනන්ද මහතාට 2004,01.29 වැනි දින ලබාදී ඇති පසුව අත්හිටුවන ලද හිඟ වැටුප් වර්ධක 03 ට අදාළ හිඟ මුදල් ගෙවා ඇති බැවින් විශ්‍රාමික ඩිපෝ අධිකාරි එච්.එම්.ඩබ්ලිව්. අබේරත්න මහතාට ද එම වරප්‍රසාද හිමිවිය යුතු බවට නිගමනය කරමි.

මෙම නඩු විභාගයේ දී දෙවන පාර්ශ්වයේ නීතිඥ මහත්ම මහත්මීන් මෙම කාර්මික ආරාවුල විභාග කිරීමට කාර්මික අධිකරණයට බලයක් නොමැති බවටත් ඒ අනුව මෙම ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිශ්ප්‍රභා කරන ලෙසටත්, ලිඛිතව හා නඩු විභාගය පැවැත්වෙන අවස්ථාවලදී ඉල්ලීම් කලත් එම ඉල්ලීම් සලකා බැලූ විට පදනම් විරහිත බැවින් අධිකරණය විසින් එම ඉල්ලීම් ප්‍රතික්ෂේප කල බව සඳහන් කරමි.

දෙවන පාර්ශ්වය 2017 චක්‍ර ලිපියට අනුව හිඟ වැටුප් ගෙවීමට ඉඩක් නොමැති බවට තර්ක කලත්, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය 2017/ චක්‍රලේඛය නොසලකා හරිමින්, 2018.10.11 ඩිපෝ අධිකාරි ඩබ්ලිව්.එම්. ආනන්ද මහතාට හිඟ මුදල් ගෙවීමට කටයුතු කර ඇති නිසාම, දෙවන පාර්ශ්වය කරන ලද තර්ක කිරීම් පදනම් විරහිත වූ බව ප්‍රකාශ කරමි.

මෙම කාර්මික ආරාවුලේ දී දෙපාර්ශ්වයම ඉදිරිපත් කළ ලිඛිත ප්‍රකාශ හා නඩුව විභාග වන අවස්ථා වලදී ඉදිරිපත් කල කරුණු සැලකිල්ලට ගත්විට, ඉල්ලුම්කරුගේ ඉල්ලීම යුක්ති සහගත හා සාධාරණ එකක් බවට මෙයින් නිගමනය කරමි.

<u>ගෙවිය යුතු මුදල ගණන් බැලූ ආකාරයට (2004.05.01 සිට 2016.12.31 2018.09.27 දක්වා මසකට එක් වැටුප් වර්ධකයකට හිමි මුදල රු. 130/- ක් වන අතර, වැටුප් වර්ධක 03 කට හිමි මුදල රු. 390/- ක් වේ.)</u>

ගෙවිය යුතු මුදල ගණන් බැලූ ආකාරය

| | |
|---|---|
| එක් වැටුප් වර්ධකයට හිමි මුදල | - රු.130.00 |
| වැටුප් වර්ධක 03 ක් සඳහා | - 130x3 |
| මසකට අදාල මුදල | - 390.00 |
| හිඟ වැටුප් වර්ධක ගෙවිය යුතු මාස ගණන 2004/05/1 සිට 2016.12.31 දක්වා | - මාස 132 |
| මසකට රු.390.00 බැගින් | - 390x132 |
| මාස 132 කට හිමි හිඟ වැටුප් මුදල | - <u>51.480.00</u> |

මේ අනුව 2004.05.01 සිට 2016.12.31 දක්වා හිඟ වැටුප් වර්ධක මුදල් වශයෙන් රුපියල් පනස් එක්දහස් හාරසිය අසූවක මුදලක් (රු. 51480.00) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් හිඟ වැටුප් වර්ධක මුදල් වශයෙන් එච්.එම්.ඩබ්ලිව්. අබේරත්න මහතාට ගෙවිය යුතු බවට නිගමනය කරමි.

ප්‍රදානය

මෙම කාරණය හේතුවෙන් කාර්මික නීතියේ හා ඉහලින්ම පිලිගැනෙන යුක්ති සහගත හා සාධාරණ නිගමනයක් වශයෙන් ඉල්ලුම්කරු වන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විශ්‍රාමික එච්.එම්.ඩබ්ලිව්, අබේරත්න මහතාට 2004.05.01 වන දින සිට 2016 දෙසැම්බර් මස 31 දක්වා විශේෂ වැටුප් වර්ධක 03 අදාලව හිඟ මුදල් වශයෙන් රුපියල් පනස් එක්දහස් හාරසිය අසූවක මුදලක් (රු. 51480.00) ගෙවීමට කටයුතු කරන ලෙසට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට මෙයින් නියෝග කරමි. තවද මෙම මුදල මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ජනරජයේ

*අතිවිශේෂ ගැසට්* පත්‍රයේ පළවූ දින සිට මාස 02 ක් ඇතුළත අදාළ මුදල ගෙවීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය කටයුතු කළ යුතු අතර, එම මුදල මාතලේ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට ද, වැඩිදුරටත් සඳහන් කර නියෝග කරමි.

(ඒ.බී. හේරත්)
බේරුම්කරු.

2023 මැයි මස 03 වැනි දින
කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

EOG 06-0020

---

මගේ අංකයඃ IR/COM/05/2018/270.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.09.27 දිනැති හා අංක 2142/88 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.09.19 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 07, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව හි පිහිටි ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා කාර්මික නිලධාරීන්ගේ සංගමය සහ කොළඹ 07, නිදහස් චතුරශ්‍රයෙ හි පිහිටි ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.05.08 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මැයි මස 26 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා කාර්මික නිලධාරීන්ගේ සංගමය,
ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව,
කොළඹ 07,

*(පළමු පාර්ශ්වය)*

*එදිරිව*

නඩු අංකයඃ A/101/2019.
ගොනු අංකය ඃ IR/COM/05/2018/270.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,

*(දෙවන පාර්ශ්වය)*

අතර පවත්නා කාර්මික ආරවුල

ප්‍රදානය

ගරු කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී උක්ත ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් අංක IR/COM/05/2018/270 හා 2019 සැප්තැම්බර් මස 19 වැනි දින දරන ලිපියෙන් මා පත්කර ඇත.

ආරාවුලට තුඩුදුන් කාරණය.

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝග ප්‍රකාරව පහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගතවී ඇති කාර්මික ආරාවුල

1. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා කාර්මික නිලධාරීන්ගේ සංගමය, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, කොළඹ 07. එක් පාර්ශ්වයක් වශයෙන්ද
2. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, නිදහස් චතුරස්‍රය, කොළඹ 07. අනෙක් පාර්ශ්වයද වේ.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් ඒ.විමලවීර මහතා විසින් IR/COM/05/2018/270 හා 2019 අගෝස්තු මස 26 වැනි දින දරන ලිපියේ සඳහන් කර ඇත්තේ " ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 2018 වර්ෂයේ සංශෝධනය කිරීමේදී JM 1-1 වැටුප් කේතයෙහි සිටි ඇතැම් තනතුරු MM 1-1 වැටුප් කේතයෙහි පිහිටුවද ඒ වන විට JM 1-1 සමාන වැටුප් කේතයේ සිටි 1 ශ්‍රේණියේ කාර්මික සහකරුවන්ට (කාර්ය නිලධාරීන් ද ඇතුලුව ) MM 1-1 වැටුප් තලය ( දරන්නන්ට පමණක් පුද්ගලික වන සේ හෝ) ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ලැබිය යුතු සහන කවරේද? යන්න පිළිබඳව වේ.

ආරාවුල සම්බන්ධයෙන් විසඳිය යුතු ගැටළු,

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව 2018 කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමේදී JM 1-1 වැටුප් කේතයේ සිට MM 1 කේතයේ පිහිටු වීමේදී සුදුසුකම් බලපෑවේද? JM 1 සිට 1 ශ්‍රේණියේ කාර්මික සහකාරවරුන් MM 1 නොපිහිටුවීමට බලපෑ හේතු කවරේද? එසේ පිහිටුවීමේදී කාර්ය මණ්ඩලය අනුමත කාර්ය මණ්ඩලයට බලපෑමක් වේද?

කාර්මික අධිකරණයේ නියෝගය මත ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා කාර්මික නිලධාරීන්ගේ වෘත්තීය සමිතිය 2019.10.28 දිනැති උත්තර ප්‍රකාශයෙහි විශේෂ සටහන්වල සඳහන් පහත සිද්ධි පිළිබඳව අවධානය යොමු කළෙමි:

විස්තර ප්‍රකාශනයේ විශේෂ සටහන් 01.

1 ශ්‍රේණියේ කාර්මික සහකාරවරුන්ගේ වැටුප් සහකාර අධ්‍යක්ෂක පාලක හා කළමණාකරුවන්ගේ වැටුපට වඩා පහත දැමූ අවස්ථාවේ 1994.09.29 වැනි දින නිවැරදි කළ බව.

විස්තර ප්‍රකාශනයේ විශේෂ සටහන් 02.

1 ශ්‍රේණියේ කාර්මික සහකාරවරුන්ගේ සුදුසුකම් පමණක් පදනම් කරගෙන පාලකවරු වශයෙන් තනතුරු වෙනස්කර නිලධාරීන් 03 දෙනෙකු JM 1 සිට MM 1 පිහිටුවීම.

විස්තර ප්‍රකාශයේ විශේෂ සටහන් 03.

1 ශ්‍රේණියේ කාර්මික සහකාරවරුන්ද MM 1 කේතයේ පිහිටුවන ලෙස ඉල්ලීමක් කල විට එය ඩිප්ලෝමාධාරීන් MM 1 කේතයට නුසුදුසු බව පවසමින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ බව ද නමුත් එම ඩිප්ලෝමා සමඟ වසර 10ක පළපුරුද්ද ඇති අය MM1 කේතයට ප්‍රමාණවත් බව පවසමින් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ කඳුරට සේවයට සහකාර අධ්‍යක්ෂකවරයෙකු ලෙස පත්කර ගැනීම

ඉල්ලුම්කරුවන්ගේ විස්තර ප්‍රකාශනයට වග උත්තරකාර ආයතනය පිළිතුරු සැපයීමක් හෝ විස්තර ප්‍රකාශනයක් දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර නොමැත. මේ සම්බන්ධව කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරීගේ සිහි කැඳවීමට 2019.12.20 දිනැති ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂක ජනරාල්ගේ ලිපිය මගින් සති 03 ක කාලයක් ඉල්ලා ඇතත් ඒ අනුව ක්‍රියා කළ බවත් ගොනුව පරික්ෂා කිරීමේදී නොපෙනේ. මෙම නඩුව 2020.02.18 වැනි දින ආරම්භ කරන ලද අතර වගඋත්තරකාර ආයතනයේ පිළිතුරු ප්‍රකාශයත් නීති නිලධාරිනි චම්පා විජයවර්ධන මහත්මිය විසින් 2020.03.01 වැනි දින කාර්යාලයට ලබාදී ඇති අතර 2020.06.30 දින ඉල්ලුම්කාර පාර්ශ්වයට විවෘත අධිකරණයේ දී භාරදී ඇත.

නඩුව විභාගයට ගත් අවස්ථාවේ ඉල්ලුම්කරුවන් තම විස්තර ප්‍රකාශන ගරු අධිකරණයට හා වගඋත්තරකාර පාර්ශ්වයට ද ඉදිරිපත් කර ඇත. ඉල්ලුම්කාර පාර්ශ්වයේ පළමුවෙනි විස්තර ප්‍රකාශයෙහි සඳහන් කරුණුවලට පිළිතුරු සැපයීමට වග උත්තරකරුවන් අපොහොසත් වී ඇත. ඉල්ලුම්කරුවන්ගේ විස්තර ප්‍රකාශනයේ සහ ගරු අධිකරණයට ඉදිරිපත් කරන ලද දිවිරුම් ප්‍රකාශණයටත් එම කරුණු පිළිබඳව හබ කිරීමක් වගඋත්තරකාර පාර්ශ්වය සිදුකර නැත. මෙම ඉල්ලුම්කරුවන්ගේ මූලික ගැටළුව විස්තර ප්‍රකාශයේ 1 ඡේදයේ සහ ජනත දීපාල් අලුත්වත්ත මහතාගේ දිවිරුම් ප්‍රකාශයේ V ඡේදයට අදාලව හබ කිරීමක් සිදුව නැත. එමෙන්ම විස්තර ප්‍රකාශයේ විශේෂ සටහන් කර ඇති සිද්ධිය පිළිබඳවද හබ කිරීමක් සිදුකර නැත.

විශේෂයෙන් විස්තර ප්‍රකාශනයේ විශේෂ සටහන් 02 හි 10 වන පිටුව 1 ශ්‍රේණියේ කාර්මික සහකාරවරුන්ගේ සුදුසුකම් පමණක් පදනම් කරගෙන පාලකවරුන් ලෙස තනතුරු ලබාගත් නිලධාරින් 02 කට JM 1 සිට MM 1 වැටුප් තලයේ පිහිටුවීම.

විශේෂ සටහන් 03, 1 ශ්‍රේණියේ කාර්මික සහකාරවරුන්ද MM 1 කේතයේ පිහිටුවන ලෙස අපි විසින් දිගින් දිගටම කරන ලද ඉල්ලීම් පාලන අධිකාරිය ප්‍රතික්ෂේප කරනු ලැබුවේ ඩිප්ලෝමාධාරීන් MM 1 කේතයට නුසුදුසු බව පවසමින් වුවද ඩිප්ලෝමාව සමග වසර 10 පළපුරුද්ද MM 1 කේතයට ප්‍රමාණවත් බව.........

ඉහත ඡේදය පිළිබඳව වගඋත්තරකාර ආයතනය කිසිදු හබ කිරීමක් නොකිරීමෙන් පෙනී යනුයේ එවැන්නක් සිදුවී ඇති බවයි. වගඋත්තරකාර ආයතනය විසින් 2020 මාර්තු 10 ඉදිරිපත් කරන ලද ප්‍රථම ප්‍රකාශයේ 5 වන ඡේදය අනුව කාර්මික සහකාර 1 ශ්‍රේණියේ JM 1-1 පියවර සඳහා ඇතුලත් කර ඇති බැව් සටහන් කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සේවකයන් ශ්‍රේණිගත කිරීමේදී කාර්මික සහකාර 1 ශ්‍රේණිය JM 1 ඇතුලත් වන බැවින් ඉල්ලුම්කරුවන් JM 1 ශ්‍රේණියට අයත් බැව් පැහැදිලි වේ.

අදාළ ඉල්ලුම්කරුවන්ගේ තනතුරු සටහන් කිරීමේදී පිටු අංක 370 - 371 - 372 - 373 අනුව ලේඛනයේ අංක 03 අංක 24 ඉංජිනේරුවන් වන අතර අනෙක් සියලු දෙනා සහකාර කාර්මික 1 ශ්‍රේණියේ වන බැව් සනාථ වේ. අදාළ තනතුරු පිළිබඳව විස්තර විවෘත අධිකරණයේදී දෙවන පාර්ශ්වයට භාරදී ඇතත් එම නිලධාරීන් JM 1 අදාළ නොවන බවට කරුණු ඉදිරිපත් කිරීමට දෙවන පාර්ශ්වය අසමත් වී ඇත.

පළමු පාර්ශ්වය එම විස්තර ප්‍රකාශනය මගින් JM 1 සිට MM 1 තනතුරු ලැබුණු අය සම වැටුප් තත්ත්වයේ බැව් සනාථ කර ඇත. එසේ නොවන බවට හබ කිරීමක් 2 වන පාර්ශ්වය සිදුකර නැත.

නඩුව විභාග වන අවස්ථාවේ සාක්ෂි මෙහෙයවීමත් හරස් ප්‍රශ්න ඇසීමත් 2 වැනි පාර්ශ්වයෙන් සිදු වී නැත. එමගින් පළමු පාර්ශ්වයේ කරුණු පිළිගැනීමක් 2 වැනි පාර්ශ්වය සිදුකර ඇති බැව් තහවුරු වේ. 2023.03.08 දින නඩුව විභාගයට ගත් අවස්ථාවේ කළමණාකරන දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව තනතුරු දිය නොහැකි බවට උපදෙස් දුන් බව වග උත්තරකාර පාර්ශ්වය ප්‍රකාශ කර ඇත. මෙම උපදේශය X 01 ලෙස ලකුණු කරන බවක් සඳහන් කර ඇතත් එය ඉදිරිපත් කර නැත. ආයතනයක සේවකයන් ශ්‍රේණිගත කිරීමකදී කළමණාකරන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ගත යුතු බැව් දෙවන පාර්ශ්වය සටහන් කලද යම් යම් අවස්ථා වලදී එවැන්නක් කර නොමැති බැව් ඉල්ලුම්කරුගේ විස්තර ප්‍රකාශයේ විශේෂ සටහන් 02 හා 03 න් හෙළිවේ.

JM 1 සිට MM 1 අන්තර්ග්‍රහනය කිරීමේදී එම අයගේ සුදුසුකම් පළපුරුද්ද අනුව අන්තර්ග්‍රහනය කරන බවත් දෙවන පාර්ශ්වය සඳහන් කර නැත. යම් ශ්‍රේණියක සිටින අය තවත් ශ්‍රේණියකට අනතර්ග්‍රහනය කිරීමේදී කොටසකට පමණක් සිදුකිරීම අසාධාරණ ක්‍රියාවකි. මේ අනුව අන්තර්ග්‍රහනය පිළිබඳව ලිඛිත උපදෙස් නොමැති නම් කොටසකට පමණක් සිදුකිරීමෙන් ඉල්ලුම් කරුවන්ට අසාධාරණයක් සිදු වී ඇති බැව් පෙනේ. වගඋත්තරකාර පාර්ශ්වය යෝජනා කරන ලද සමථය පිළිබඳව ඉල්ලුම්කරුගේ එකඟතාවය පළකලද එයද ක්‍රියාත්මක කරලීමට වග උත්තරකාර පාර්ශ්වය උනන්දුවක් දක්වා නැත.

මේ අනුව බේරුම්කරුට ඉදිරිපත් කර ඇති ගැටළුව වන JM 1- 1 සමාන වැටුප් කේතයේ සිට 1 ශ්‍රේණියේ සිටි කාර්මික සහකාරවරුන්ට MM 1-1 වැටුප් තලය නොපිහිටු වීමෙන් අසාධාරණයක් සිදු වී තිබේද? යන ප්‍රශ්ණයට පිළිතුර ඔව් යන්නයි. ඒ අනුව පහත සඳහන් ප්‍රදානය කරමි:

2018 මැයි මස සිට MM 1-1 වැටුප් තලයේ පිහිටු වීමෙන් හිඟ වැටුප් වශයෙන් පහත සඳහන් පරිදි ගණනය කරන ලද මුදල වන රුපියල් 56,755,356.40 (පන්කෝටි හැටහත් ලක්ෂ පනස් පන් දහස් තුන්සිය පනස් හයයි ශත හතලිහක්) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද දින සිට මසක් ඇතුලත සහකාර කම්කරු කොමසාරිස් මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කරන ලෙස මෙයින් නියෝග කරමි.

ලේඛනය,
සේවා අංකය

| | | | |
|---|---|---|---|
| 4299 | ඒ.එච්.ජේ.ඩී.අලුත්වත්ත | කාර්මික සහකාර 1 | 1342166.60 |
| 3785 | ජී.ටී.කේ කුමාර | කාර්මික සහකාර 1 | 1484668.20 |
| 4025 | එන්. කේ. පී. පී. වෛද්‍යස්කර | ඉංජිනේරු | 1147440.30 |
| 4320 | පී.පී.සාලිය 1 | කාර්මික සහකාර | 1350874.10 |
| 4029 | බී.ඒ.වික්‍රමතිලක | කාර්මික සහකාර 1 | 1549587.80 |
| 4031 | යූ.අයි.පෙම්මාවඩු | කාර්මික සහකාර 1 | 1456569.20 |
| 4265 | බී.ආර්.ආර්.යූ.එස්,බස්නායක | කාර්මික සහකාර 1 | 1350874.10 |
| 4277 | ජී. එම්. වසන්ත | කාර්මික සහකාර 1 | 1402874.10 |
| 4280 | ඒ.එච්.මොරවක | කාර්මික සහකාර 1 | 1402874.10 |
| 3109 | ඩී. එස්. ඩබ්.එස්.යාපා | කාර්මික සහකාර 1 | 1397682.00 |
| 3140 | ඩබ්.ඒ.පී.ඩී.බී.ආර්. අජිත් | කාර්මික සහකාර 1 | 1484205.30 |
| 3167 | ඩබ්.ජේ.එම්.එම්. පෙරේරා | කාර්මික සහකාර 1 | 1407496.50 |
| 3803 | ආර්.හේවගේ | කාර්මික සහකාර 1 | 1527597.00 |
| 4005 | ඩබ්. එම්. ඩී. ඒ. ඩී. විජයනායක | කාර්මික සහකාර 1 | 1401292.10 |
| 4026 | එස් කේ පාන්ඩිප්පෙරුම | කාර්මික සහකාර 1 | 1507391.10 |
| 4038 | ජේ.ඩබ්.ඩී.එස්.විජය කුමාර | කාර්මික සහකාර 1 | 1436511.00 |
| 4041 | එස්. රුවන්පුර | කාර්මික සහකාර 1 | 1529734.20 |
| 4042 | ඩබ්. ඒ. කපිලනන්ද | කාර්මික සහකාර 1 | 1375292.10 |
| 4266 | එම්.එස්.පින්තො | කාර්මික සහකාර 1 | 1342166.60 |
| 4270 | ඩී.ඩී.විජේසිංහ | කාර්මික සහකාර 1 | 1155842.30 |
| 4274 | කේ.ජී. පී. ප්‍රසන්න | කාර්මික සහකාර 1 | 1275942.10 |
| 4283 | එච්.එච්.ඒ.එස්.විජය සිරි | කාර්මික සහකාර 1 | 1350874.00 |
| 4286 | අයි.කේ.ඩී.සී.හේමපාල | කාර්මික සහකාර 1 | 1155842.30 |
| 4296 | ටී.ඩී.ඩී.සුසන්ත | ඉංජිනේරු | 985136.10 |
| 4298 | ඩබ්.එස්, ලියනගේ | කාර්මික සහකාර 1 | 1100565.20 |
| 4301 | එම්.සී.ජේ.සල්ගාදු | කාර්මික සහකාර 1 | 1342166.60 |
| 4305 | කේ.ජී.ආර්. ධම්මික | කාර්මික සහකාර 1 | 1394166.60 |
| 4307 | එල්.එල්. සුජීව | කාර්මික සහකාර 1 | 1350452.10 |
| 4312 | කපිල ප්‍රියන්ත වෙදගේ | කාර්මික සහකාර 1 | 1350874.10 |
| 4315 | ජේ.පී. ගාල්ලගේ | කාර්මික සහකාර 1 | 1394166.60 |
| 4322 | කේ.ජී. පියසිරි | කාර්මික සහකාර 1 | 1402874.10 |
| 4325 | කේ.ඩී.ඒ.පී.කහද | කාර්මික සහකාර 1 | 1272452.10 |
| 4327 | එස්.එම්. ඩී. ඒ කුමාර | කාර්මික සහකාර 1 | 1394166.60 |
| 4328 | බී.ආර්.ඩී.බී.ධනසේකර | කාර්මික සහකාර 1 | 1318689.00 |
| 4329 | ඒ.ඩබ්.ලියනගේ | කාර්මික සහකාර 1 | 1318689.00 |
| 4330 | ඩබ්.එම්.එල්.විතාන | කාර්මික සහකාර 1 | 1394166.60 |
| 4333 | එස්.ඩී.කේ.වේරගොඩ | කාර්මික සහකාර 1 | 1045288.10 |
| 4334 | බී.එස්.පී. ප්‍රනාන්දු | කාර්මික සහකාර 1 | 1402874.10 |
| 4335 | ඒ.සී.කේ.පී. කුලරත්න | කාර්මික සහකාර 1 | 1298452.10 |
| 4362 | ආර්.එම්.එස්. රත්නායක | කාර්මික සහකාර 1 | 1315422.90 |
| 4363 | ආර්.පී. හේවාවිදාන | කාර්මික සහකාර 1 | 1341981.90 |
| 3781 | එස්.එම්.මැද්දෙගොඩ | කාර්මික සහකාර 1 | 1496975.40 |
| | | එකතුව | 56755356.40 |

මෙය සාධාරණ හා යුක්ති සහගත තීන්දුවක් බව සහතික කරමි.

2023 මැයි මස 08 වැනි දින.
කොළඹ බේරුම්කරණ අංශය හා
කාර්මික අධිකරණයේදී ය.

ඒ.ඒ.වීරසූරි,
බේරුම්කරු.

EOG 06-0021

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.